# ආදරණීය ශ්‍රී ලංකා ඡායාරූප තරඟය සහ ප්‍රදර්ශනය
# Adaraneeya Sri Lanka Photo Competition & Exhibition

ආදරණීය ශ්‍රී ලංකා රූපවාහිනී වැඩසටහනට සමගාමීව පැවැත්වෙන මෙම ඡායාරූප තරඟය සහ ප්‍රදර්ශනය, වැඩසටහන සහ ප්‍රේක්ෂකයින් අතර අන්තර් සබඳතාවක් ඇති කිරීමත්, වැඩසටහන පිළිබඳ ආකර්ෂණයක් ඇති කිරීමත්, දේශීය සංචරනය වැඩි දියුණු කිරීමත් අරමුණ කරගෙන පැවැත්වේ.

වයස් භේදයකින් තොරව ලංකාවේ සියලුම පුරවැසියන්ට මෙම ඡායාරූප තරඟය සඳහා සහභාගි විය හැකිය. ඡායාරූප තරඟය පහත සඳහන් අංශ වලින් පැවැත්වේ.

**සොබා දහම (Nature Category)**

වන ජීවී ඡායාරූප, භූමි දර්ශන හා ඒ හා සම්බන්ධ අනෙකුත් නිර්මාණාත්මක ඡායාරූප මෙම අංශයට අයත්වේ.

**සංස්කෘතික උත්සව සහ උරුමයන් ( Cultural Festival & Heritage Category And Heritage)**

ශ්‍රී ලංකාවේ විවිධ ආගම් සහ විවිධ සංස්කෘතීන් තුළ විවිධ විචිත්‍ර සංස්කෘතික උත්සව දක්නට ඇත. එමෙන්ම ඓතිහාසික උරුමයන් හා මෙම උත්සව වලට අයත් විවිධ අවස්ථා දැක්වෙන නිර්මාණාත්මක ඡායාරූප මේ සඳහා ඉදිරිපත් කළ හැක. උදාහර්ණ ලෙස දළදා පෙරහැර, විවිධ ශාන්ති කර්ම, විවාහ මංගල්‍ය උත්සව ආදිය දැක්විය හැක.

**ජීවන රටා ( Life Style Category)**

තම ජීවිකාව ලෙස ශ්‍රී ලාංකිකයින් විවිධ ජීවන වෘත්තීන් වල නියැලේ. බොහෝ විට සොබා දහම සහ සබැඳි මෙම ජීවන රටාවන් සංචරනයේදී නෙත ගැටේ. ඒ හා සබැඳි නිර්මාණාත්මක ඡායාරූප මෙම අංශය සඳහා ඉදිරිපත් කළ හැක.

**ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ ත්‍රාසජනක ක්‍රීඩා (Sport, Activities and Adventurers Sport)**

එක් අයෙකුට එක් අංශයක් සඳහා නිර්මාණ එක බැගින් අංශ තුන සඳහා ඡායාරූප 03 ක් ඉදිරිපත් කළ හැක.

**ඡායාරූප වල හිමිකම් අයිතිය**

**Copyrights of the Photographs.**

ඡායාරූප වල පූර්ණ හිමිකම් අයිතිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සතුවේ. වානිජ අරමුණු වලින් තොරව, ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සහ අධ්‍යාපනික වැඩසටහන් සඳහා ඕනෑම මාධ්‍යයක (මුද්‍රිත, ඉලෙක්ට්‍රෝනික් සහ අන්තර්ජාල මාධ්‍ය) මෙම ඡායාරූප භාවිතා කිරීමේ අයිතිය ඉහත දැක්වූ ආයතන දෙකට හිමිවේ. එමෙන්ම මෙම ඡායාරූප භාවිතා කෙරන අවස්තාවන් වලදී හැකි සෑම විටකම නිර්මාණකරුවාගේ නම සඳහන් කෙරේ.

<u>**ඡායාරූප එවිය යුතු ලිපින**</u>

ඊමේල් මගින් එවන්නේ නම්: adaraneeya&rupavahini.lk

තැපෑලෙන් එවන්නේ නම්: ආදරණීය ශ්‍රී ලංකා ඡායරූප තරඟය<br>අධ්‍යාපන වැඩසටහන් අංශය<br>ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව<br>කොළඹ 07.

ගෙනවිත් භාරදීම: ඉහත ලිපිනයේ රූපවාහිනී සංස්ථා කවුන්ටරයට භාර දිය හැක.

## ඡායාරූප භාර ගැනීමේ දිනය අප්‍රේල් 15 සිට ජුලි 15 දින දක්වා.